# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 21 දරන ජගද්දලා සමාජ සුභසාධක ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2009 අංක 21 දරන ජගද්දලා සමාජ සුභසාධක ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 08 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 18/2005.

## ජගද්දලා සමාජ සුභසාධක ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ජගද්දලා සමාජ සුභසාධක ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, එකී ආයතනයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් බණ්ඩාරගම, කිදෙල්පිටිය ශ්‍රී පුණ්‍යවර්ධනාරාමයේ පිහිටුවාගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී ආයතනය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට සහ ඉටු කරගෙන ඇති හෙයින් ද, ඒ ආයතනය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 21 දරන ජගද්දලා සමාජ සුභසාධක ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජගද්දලා සමාජ සුභසාධක ආයතනයේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජගද්දලා සමාජ සුභසාධක ආයතනය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ජගද්දලා සමාජ සුභසාධක ආයතනය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව අනාථ, අත්හළ සහ අසරණ දරුවන් වෙනුවෙන් නිවාස පිහිටුවා පවත්වාගෙන යාම ;

(ආ) නිවාසවල සිටින අනාථ දරුවන්ට යහපත් ජීවන තත්ත්වයන් සලස්වා ඔවුන් නඩත්තු කරගෙන යාම සහතික කිරීම ;

(ඇ) නිවාසවල සිටින දරුවන්ගේ නිරන්තර අධ්‍යාපනික දියුණුවට අවශ්‍ය පහසුකම් සහ නිර්මාණශීලී හැකියාවන් වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම ;

(ඈ) නිවාසවල සිටින දරුවන්ට වෘත්තීය මාර්ගෝපදේශකත්වය සැපයීම හා වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම ;

(ඉ) නිවාසවල නේවාසිකව සිටි දරුවන් නිවාස හැරගිය පසු ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය පිළිබඳව අවශ්‍ය අවස්ථාවල දී අධීක්ෂණය කිරීම සහ සහාය ලබාදීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම සහ එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීම ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉෂ්ඨ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා කාරණා සහ දේ, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සභාපති, උප සභාපති, ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන එකොළොස් දෙනෙකුට නොඅඩු කාරක සභික සංඛ්‍යාවකගෙන් සමන්විත වූ

(මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, කිදෙල්පිටිය ශ්‍රී පුණ්‍යවර්ධනාරාම විහාරස්ථානයේ විහාරාධිපති ගෞරවාචාර්ය කිදෙල්පිටියේ ආරිය මෛත්‍රී ස්වාමීන්වහන්සේ සංස්ථාවේ ප්‍රථම සභාපතිවරයා විය යුතු අතර, සෑම අනුප්‍රාප්තික විහාරාධිපතිවරයකු ම නිලබලයෙන් පත්වන සභාපතිවරයකු විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ජගද්දලා සමාජ සුභසාධක ආයතනයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය සහ කමිටුවේ බලතල, චර්යාව සහ කාර්යයන් ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කමිටුවේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ඒ රැස්වීම් පවත්වන දිනය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යායපත්‍ර හා රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂය වීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ආයතනය විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති වලට යටත්ව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. සභාපති සහ ලේකම් හෝ භාණ්ඩාගාරික හෝ තත්කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලබූ නිලධරයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

11. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

විගණනය සහ ගිණුම්.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ උපවගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.